# නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය සහ විදුසර

කලින් පවසා ඇති පරිදි නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය යනු දැනුම පිළිබඳ දැනුමකි. නො එසේ නම් දැනුම ගැන ප්‍රවාදයකි. දැනුම ගැන ඒ ප්‍රවාදය මත පිහිටා ගොඩනැගුණු දැනුම ද තව බොහෝ ය. මේ දැනුමේ ද නිර්මාපකයා බොහෝ විට නලින් ද සිල්වා මහාචාර්යතුමා ය. පානදුරේ දී උපත ලැබූ නලින් ද සිල්වා මහතා සිය පාසල් අධ්‍යාපන කටයුතු නිමා කළේ 1962 වසරේ දී කොළඹ රාජකීය විද්‍යාලයෙනි. ඒ වසරේ දී ශුද්ධ හා ව්‍යවහාරික ගණිතය සඳහා වන රාජකීය විද්‍යාල ත්‍යාගය ලබාගත් හෙතෙම 1967 දී සිය පළමු උපාධිය පේරාදෙණි සරසවියෙන් ද 1970 පශ්චාත් උපාධිය මහා බ්‍රිතාන්‍යයේ සසෙක්ස් සරසවියෙන් ද ලබාගත්තේ ය. පේරාදෙණි සරසවියේත් පසුව කොළඹ සරසවියේත් කථිකාචාර්යවරයකු ලෙස සේවය කළ නලින් ද සිල්වා මහතා 1992 වසරේ දී කොළඹ සරසවි බලවතුන් ගේ කුප්‍රකට තීරණයකට අනුව වැඩ තහනමට ලක් විය.

තමා දැරූ අදහස් නිසා සරසවිය අතහැර යෑමට සිදු වූ ඒ මහතාට නැවතත් සරසවි සේවයට එක් වීමට වසර 10ක් බලා සිටීමට සිදු විය. දැනට නලින් ද සිල්වා මහාචාර්යතුමා කැලණි විශ්වවිද්‍යාලයේ ගණිත අධ්‍යයන අංශයේ අංශාධිපතිවරයා ලෙස කටයුතු කරයි.

නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය ගැන අදහස් මුල් වරට ඉදිරිපත් වූයේ ආචාර්ය නලින් ද සිල්වා 1986 වසරේ දී ලියා පළ කළ "මගේ ලෝකය" කෘතියෙනි. එතැන් සිට ගත වූ වසර 22ක කාලය තුළ ඒ මහතා ලියා පළ කළ පොත් පත් රැසකි. මේ කාල සීමාව තුළ උපාලි පුවත්පත් සමාගමේ ඉරිදා දිවයින, දිනපතා දිවයින, The Island, විදුසර සහ කලක් පළ වූ වත්මන සඟරාවට නලින් ද සිල්වා ආචාර්යතුමා ලිපි ලේඛන තුන් දහසකට ආසන්න ප්‍රමාණයක් සපයා ඇත. අද 21 වැනි සංවත්සරය සමරන විදුසරට ආරම්භයේ සිට ම එතුමා ගේ දායකත්වයක් විය. විශේෂයෙන් 2002 වසරේ අගෝස්තු මාසයේ සිට අඛණ්ඩව ලියැවෙන "අපේ ප්‍රවාද " ලිපි පෙළ මෙරට තරුණ පරපුරේ අදහස්, සිතුම් පැතුම් නව මානයකට ගෙන එමට සමත් ව ඇත. උසස් පෙළ විභාගයෙන් පසු ද විදුසරට මේ රටේ තරුණ බුද්ධිමතුන් ඇද බැඳ තබන ප්‍රබල රැහැනක් වන්නේ "අපේ ප්‍රවාද" ලිපි පෙළයි.

පේරාදෙණි වෛද්‍ය පීඨයේ වසර 6කට ආසන්න කලකුත්, රජරට වෛද්‍ය පීඨයේ වසරකට මඳක් වැඩි කලකුත් සිටි මා නිරීක්ෂණය කළ දෙයක් නම් ඒ ස්ථාන දෙකේ ම සති අන්ත සහ දිනපතා පුවත්පත්වලට අමතරව අඛණ්ඩව ලබාගන්නා එකම පුවත්පත විදුසර බවයි. සතියේ කුමන දිනයක දවල් වරුවේ බැලුව ද විදුසරට "නිවනක්" නැති වීමෙන් පැහැදිලි වන කරුණ නම් උසස් පෙළ විභාගයෙන් පසු ද ඊට ඇති ඉල්ලුමයි.

බටහිර චින්තනය පිළිබඳ සාකච්ඡාවකින් ඇරඹුණු අපේ ප්‍රවාද ලිපි පෙළ අද බොහෝ දුර පැමිණ ඇත. බටහිර සම්භාව්‍ය භෞතික විද්‍යාව, ක්වොන්ටම් භෞතික විද්‍යාව, පශ්චාත් නූතනවාදී යැයි පැවසෙන අදහස්, ථෙරවාදය, මහායානය, හින්දු දහම, සිංහල සාහිත්‍ය විචාරය, මනස, මතකය ආදී මාතෘකා ඔස්සේ දැන් එය අපේ ඉතිහාසය ගැන නව ප්‍රවාද කරා යොමු වෙමින් ඇත.

අද එක්වර ම මේ ලිපි පෙළේ ඇති වැදගත්කම යමකුට නො වැටහුණ ද තව වසර තිහකින් හතළිහකින් නොඑසේ නම් තවත් සියවසකින් ජාතියේ මුළු මහත් ගමන් මග ම ඔසවා තැබූ ලිපි පෙළක් ලෙස "අපේ ප්‍රවාද" නිසැක ලෙස ම සම්භාවනාවට පාත්‍ර වනු ඇත. මෙය අවබෝධ කර ගැනීමට එක් කරුණක් පමණක් මෙහි සඳහන් කරමි. ක්‍රි.ව. දෙවන සියවසේ දකුණු ඉන්දියාවේ ආන්ද්‍ර ප්‍රදේශයේ බිහි වූ සුවිශිෂ්ට ප්‍රාඥයකු නම් නාගර්ජුන හිමියෝ ය. උන් වහන්සේ මාධ්‍යමික සාපේක්ෂතාවාදය නමින් දැනුමක් නිර්මාණය කළ හ. ශුන්‍යතාව නම් සංකල්පය බිහි කළේ නාගර්ජුන හිමියෝ ය. මේ ඔස්සේ උන් වහන්සේ කළ අභියෝගය ජය ගැනීමට ථෙරවාදීන්ට නොහැකි විය. කොටින් ම දකුණු ඉන්දියාවේ ථෙරවාද මධ්‍යස්ථානය වූ ආන්ද්‍ර ප්‍රදේශයේ ථෙරවාදීන් මතවාදීය ලෙස පරාජය කෙරුමට නාගර්ජුන හිමියන්ට හැකි විය. එය අවසාන වශයෙන් දකුණු ඉන්දියාවෙන් පමණක් නො ව දකුණු ආසියානු කලාපයේ බොහෝ ස්ථානවලින් ද ථෙරවාදය තුරන් ව යෑමට හේතු විය. ලංකාවේ ථෙරවාදය රැකුණේ මෙහි දී නාගර්ජුන හිමියන් මතවාදීයව පරාජය කළ නිසා නො ව ථෙරවාදය රැක ගැනීමට මහා විහාරීය භික්ෂූන් වහන්සේ ලා අනුගමනය කළ

සුවිශේෂ උපක්‍රම නිසා ය. ගත වූ සියවස් 18ක කාලය තුළ නාගර්ජුන හිමියන් ගේ අභියෝගය ජය ගැනීමට ථෙරවාදීන්ට නොහැකි වූ අතර තීරණාත්මක ලෙස එම අභියෝගය බාරගෙන මතවාදීය ලෙස මහායානය පරාජය කිරීමට හැකි වන්නේ 2004 වසරේ දී ය. ඒ විදූසර පුවත්පත ඔස්සේ ය. 2004 ජුනි මස 16 වැනි දින පළ වූයේ "අපේ ප්‍රවාද" ලිපි පෙළේ සියවැන්නයි. බොහෝ දෙනකු දැන සිටියේ යැයි අපේකෂා කළ නොහැකි වුව ද එම ලිපිය වසර 1800කට පසු මහායානය අභිබවා ථෙරවාදයට ජය කිරුළ හිමි කර දුන් ලිපියයි. වසර දෙකකින් තුනකින් නැත්නම් දහයකින් සියල්ල සිදු වී හමාර විය යුතු යැයි කල්පනා කරන, තම ජිවිත කාලය තුළ සියලු දේ ලබාගත යුතු යැයි සිතන කලබලකාරයකුට, හෝ බලලෝභියකුට හෝ මෙවැනි දෙයක වැදගත්කම අවබෝධ නො වේ. සෙමින් වුව ද ශක්තිමත් ගමනක් ඉදිරියට ඇදෙයි. එහි ප්‍රතිඵල එක රැයින් බලාගත නොහැකි ය. ඒ සඳහා ඇතැම් විට අපේ ජීවිත කාලය ප්‍රමාණවත් නො වනු ඇත. කෙසේ වෙතත් එහි ප්‍රතිඵල ලැබෙන විට ඒ අදහස්, ප්‍රවාද සමාජගත කළ විදූසරට ද නිසි ගෞරවය, හිමි තැන ඉතිහාසය විසින් ලබා දෙනු ඇත.

*රජරට වෛද්‍ය පීඨයේ කථිකාචාර්ය*
**චන්න සුදත් ජයසුමන**